# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1421/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
02/09/2024
පැය 1345

# මාධ්‍ය නිවේදනය

## 01. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - නාඋල පොලිස් වසම.

2024.09.02 වන අද දින අළුයම් කාලයේ නාඋල පොලිස් වසමේ රජාවෙල කුඩුම්රිස ප්‍රදේශයේ වන අලි පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට නාඋල පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ කෝන්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
මරණකරු

මරණකරු වෙලන්ගොල්ල ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයකට සහභාගි වී නැවත නිවසට පැමිණෙමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. සැකකටයුතු මරණයක් - මහව පොලිස් වසම.

2024.09.02 වන අද දින උදෑසන කාලයේ මහව පොලිස් වසමේ ගොඩහිටිගම, ඉහළ වැවේ පුද්ගලයෙකු මියගොස් ඇති බවට 119 මධ්‍යස්ථානයට ලද පණිවිඩයක් අනුව මහව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

මරණකරු වයස අවුරුදු 52 ක් වූ මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදු කර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන් වීමක් - කොච්චිකඩේ පොලිස් වසම.

2024.09.02 වන අද දින අළුයම් කාලයේ කොච්චිකඩේ පොලිස් වසමේ පෝරුතොට ලෙල්ලම ප්‍රදේශයෙන් ධීවර රැකියාව සඳහා බෝට්ටුවකින් පිටව ගිය පුද්ගලයින් දෙදෙනෙකු එම බෝට්ටුව පෙරලීමෙන් එක් පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට ලද පැමිණිල්ලක් මත කොච්චිකඩේ පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ අය වයස අවරුදු 38 ක් වූ කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ පුද්ගලයා සොයා නාවික හමුදාව හා පොලිසිය මෙහෙයුම් දියත් කර ඇත. කොච්චිකඩේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.09.01 වන දින දහවල් කාලයේදී දෙහිවල පොලිස් වසමේ තලකොටුව වත්ත හංදිය අසලදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 126 මිලිග්‍රෑම් 290 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 වූ දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.09.01 වන දින සවස් කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ කදිරාන වත්තේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 560ක් හා හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 640ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 24, 40 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් වසම.

2024.09.01 වන දින රාත්‍රී කාලයේදී ඇතිමලේ පොලිස් වසමේ ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වීරපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ ඇතිමලේ වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**